# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2359/20 - 2023 නොවැම්බර් මස 22 වැනි බදාදා - 2023.11.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**තැපැල් කාර්යාල ආඥාපනතේ (190 වැනි අධිකාරය) 45 වගන්තිය යටතේ සකස් කරනු ලබන රීතියයි**

2020.01.01 දින සිට 2020.12.31 දින දක්වා නිකුත් කළ මුදල් ඇණවුම්

01. මුදල් ඇණවුමක් වලංගු වන්නේ එය නිකුත් කළ මාසයේ අවසන් දින සිට මාස 06ක කාල සීමාවක් සඳහා පමණි. එහෙත්, වලංගු කාලය ඉකුත් වූ මුදල් ඇණවුමකට විශේෂ අවස්ථා අනුව සලකා එය නිකුත් කළ මාසයේ අවසන් දිනයේ සිට අවුරුදු දෙකක් දක්වා මුදල් ගෙවීම ගැන සලකා බලනු ලැබේ. කෙසේ වුවත්, නිකුත් කළ මාසයේ අවසන් දින සිට අවුරුදු දෙකක් ඉක්මගිය මුදල් ඇණවුමක් නැවත වලංගු කිරීමට හෝ එහි වටිනාකම ආපසු ගෙවීමට හෝ නොහැකි අතර, එම මුදල් ඇණවුම්වල වටිනාකම රජයේ ආදායමට බැර කරනු ලැබේ.

02. එසේ වුවත්, පහත සඳහන් විශේෂ අවස්ථා යටතේ අවුරුදු දෙකක් ඉක්මගිය මුදල් ඇණවුම්වල වටිනාකම අදාල ගාස්තු අයකර ගැනීමෙන් පසු රජයේ ආදායමෙන් ආපසු ගෙවීම ගැන සලකා බැලිය හැක.

   I. මුදල් ඇණවුම් අධිකරණය වෙත් ඉදිරිපත් කර තිබීම.
   II. නීතිමය හේතූන් මත ගෙවල් කුලී පාලක මණ්ඩලයක් මගින් මුදල් ඇණවුම් රඳවාගෙන තිබීම.
   III. මුදල් ඇණවුමේ මුදල ලැබිය යුතු අය විදේශගත වී සිටීම. (විදේශ ගමන් බලපත්‍රය ඉදිරිපත් කළ යුතුය)
   IV. මුදල් ලැබිය යුතු අය දීර්ඝකාලීනව දැඩි අයහපත් සෞඛ්‍ය තත්ත්වයකින් පසුවීම. (රජයේ වෛද්‍ය නිලධාරියකුගෙන් ලබාගත් වෛද්‍ය සහතිකයකින් ඒ බව සනාථ කළ යුතුය.)

03. ඉහත 02 (I) හා (II) යටතට අදාල මුදල් ඇණවුම් මෙම *ගැසට්* නිවේදනයේ පළකරනු ලබන දින සිට මාස තුනක් ඇතුළත ඉදිරිපත් කළ නොහැකි නම් එවැනි මුදල් ඇණවුම් පිළිබඳ විස්තර අදාල නඩු අංක ආදී සමග මුදල් ඇණවුම් සේවා පාලක වෙත ලිඛිතව එවිය යුතුය. මුදල් ඇණවුම් ඉදිරිපත් කිරීමට අපහසුවන්නේ නම් ඒ බව ලිඛිතව දැන්විය යුතුය.

04. එහෙත් දැනට අධිකරණයේ පවතින නඩු වෙනුවෙන් හා වෙනත් නීතිමය අවශ්‍යතාවයන් සඳහා උසාවි නියෝග මගින් රඳවා ඇති මුදල් ඇණවුම්, ගෙවල් කුලී පාලක මණ්ඩලයක නඩු සම්බන්ධයෙන් රඳවා ගතයුතු මුදල් ඇණවුම්, දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ මට්ටමින් කරගෙන යනු ලබන විනය පරීක්ෂණයක් සඳහා පාදක වූ මුදල් ඇණවුම් මෙමගින් ආවරණය නොවේ.

05. 2020.01.01 වන දින සිට 2020.12.31 වන දින දක්වා නිකුත් කරන ලද මුදල් ඇණවුම්වලට අදාලව මෙම නිවේදනය පළ කළ දින සිට මාස තුනක් සම්පූර්ණ වන දින තෙක් ලැබෙන පැමිණිලි පමණක් සලකා බැලීමට තීරණය කර තිබේ. මෙය සාමාන්‍ය මුදල් ඇණවුම්, විද්‍යුත් මුදල් ඇණවුම්, ෆැක්ස් මුදල් ඇණවුම් හා වටිනාකම ගෙවා භාර ගන්නා මුදල් ඇණවුම් සඳහා අදාල වේ. ඉහත 02 ජේදයේ සඳහන් අවස්ථා යටතේ වූ මුදල් ඇණවුම්වල වටිනාකම රාජ්‍ය ආදායමට බැර කර ඇත්නම් එම මුදල් ඇණවුම්වල වටිනාකම මුදල් රෙගුලාසිවලට අනුව ආදායමෙන් ආපසු ගෙවීමක් ලෙස සලකා අදාල පාර්ශව වලට ගෙවීමට කටයුතු කරනු ලැබේ.

06. එබැවින්, ඉහත 02 ජේදයේ සඳහන් පරිදි මුදල් ඇණවුම් සඳහා මුදල් ආපසු ගෙවීම ගැන සලකා බැලීම පිණිස ලිඛිතව කරනු ලබන ඉල්ලීම් හා අදාල මුදල් ඇණවුම් ද සමග මුදල් ඇණවුම් සේවා පාලක වෙත පහත සඳහන් ලිපිනයට මෙම *ගැසට්* නිවේදනය පළ කල දින සිට මාස තුනක් ඇතුළත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු බවට ඒ ඒ පළාත් සඳහා, පළාත් පාලන ආයතන, ගෙවල් කුලී පාලක මණ්ඩලය, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල, රජයේ ආයතන, බැංකු, පුද්ගලික ආයතන සහ මහජනයා වෙතද මෙයින් දැනුම් දෙනු ලැබේ.

පාලක, මුදල් ඇණවුම් සේවා
මුදල් ඇණවුම් සේවා අංශය
නියෝජ්‍ය තැපැල්පති (මධ්‍යම) කාර්යාලය
තැපැල් සංකීර්ණය
තැපැල් දෙපාර්තමේන්තුව
මහනුවර

07. තවද, 2020.01.01 දින සිට 2020.12.31 දින දක්වා කාලය තුළ නිකුත් කරන ලද, මෙම නිවේදනයේ දෙවන ඡේදයේ දැක්වෙන කරුණු හතරට අදාල වන වලංගු කාලය ඉකුත් වූ මුදල් ඇණවුම් සඳහා මුදල් ආපසු ගෙවන ලෙස මෙම *ගැසට්* නිවේදනය පළ කළ දින සිට මාස තුනකට පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් භාර නොගන්නා බවත් එම මුදල් ආපසු ගෙවනු නොලබන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

08. 2020.01.01 දිනට පෙර නිකුත් කරන ලද කිසිදු මුදල් ඇණවුමක් සඳහා කුමන හේතුවක් මත හෝ මුදල් ආපසු ගෙවනු නොලැබේ.

**ශාන්ත බණ්ඩාර** (පා.ම),
ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍ය.

2023 ක් වූ නොවැම්බර් මස 22 වැනි දින,
කොළඹ දී ය.

EOG 11 - 0219/1

---

**තැපැල් කාර්යාල ආඥාපනත**

16 වන වගන්තිය යටතේ රීති

අංක 2301/58 හා 2022.10.14 දිනැති *අති විශෙෂ ගැසට්* නිවේදනයෙන් ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍යවරයා ලෙස මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සහ තැපැල් කාර්යාල ආඥාපනතේ (190 වන අධිකාරය) 16 වන වගන්තිය යටතේ, සාදන ලද රීති.

**රීති**

1928 ජූලි මස 13 වන දින අංක 7,654 දරන *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබ, කලින් කල සංශෝධිත, තැපැල් මුද්දර සහ මුද්දර ගැසු/මුද්‍රිත ලිපි ද්‍රව්‍ය විකිණීම පිළිබඳ රීති පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි 1 වන රීතිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන රීතිය ආදේශ කිරීමෙන්;
"I. තැපැල්පතිවරයාට, ඕනෑම පුද්ගලයෙකු වෙත රු. 110/= ක් වටිනා සහ ඊට අඩු වටිනාකමින් යුත් තැපැල් මුද්දර, මුද්දර ගැසු/මුද්‍රිත ලිපි ද්‍රව්‍ය විකිණීම සඳහා බලපත්‍රයක් නිකුත් කළ හැකි අතර, එසේ නිකුත් කරනු ලබන ඕනෑම බලපත්‍රයක් ඕනෑම අවස්ථාවක අවලංගු කළ හැකිය."

(2) එහි 4 වන රීතිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන රීතිය ආදේශ කිරීමෙන්;
"4. බලපත්‍ර හිමියෙකු විසින් වටිනාකම රුපියල් 110/- නොඉක්මවූ තැපැල් මුද්දර හෝ මුද්දර ගැසූ/මුද්‍රිත ලිපි ද්‍රව්‍ය, එක්වරකට මුළු වටිනාකම රුපියල් 10,000/- නොඉක්මවූ ප්‍රමාණයකින්, තැපැල් කාර්යාලයක් වෙතින් මිලදී ගැනීමට හැකියාව ඇත. එහිදී බලපත්‍ර හිමියෙකුට 2% අනුප්‍රමාණයේ කොමිස් මුදලක් ප්‍රදානය කළ යුතුය.

**ශාන්ත බණ්ඩාර** (පා.ම),
ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍ය.

වර්ෂ 2023 ක් වූ නොවැම්බර් මස 22 වැනි දින,
කොළඹ දී ය.

EOG 11 - 0219/2